VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG


# සුදු යට ඇඳුමින් එහාගිය අපනයන ආර්ථිකයක්

ශ්‍රී ලංකාවේ අපනයන පසුගිය කාලය පුරාම දැඩි අර්බුදයන්ට මුහුණ පාන ලදී. එක් පැත්තකින් එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පහත වැටෙද්දී තවත් අතකින් ලෝක අපයන තුළ ශ්‍රී ලංකා අපනයන වල ප්‍රතිශතයද අඩුවන ප්‍රවණතාවයක් පෙන්වා ඇත.එමෙන්ම අපනයන වල සැබෑ වටිනාකමද පිරිහීමකට භාජනය වී ඇත. මෙවැනි සන්දර්භයක් තුළ මෙම පිරිහීමට හේතු සාධක වූ ප්‍රධාන කරුණු විමසා බැලීම ඉතා කාලෝචිත වේ.

පසුගිය දශක දෙක තුළ තේ සහ ඇඟළුම් ශ්‍රී ලාංකීය අපනයන සංයුතිය තුළ පුරෝගාමිත්වය දැරීය. වර්තමානයේදී මෙම උප අංශ දෙක අපනයන වල මුළු වටිනාකමින් 52% කට පමණ දායකත්වය සැපයුවද අපනයන වල සිදුවන පසුබෑමට පිළියමක් සැපයීමට මෙම අංශ දෙක අපොහොසත් වී ඇත. ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපයනය කර්මාන්තයෙහි කාලීන ගමන්මග සහ අපනයන වෙළඳාම තුළ එහි වෙනස්වෙමින් පවතින භූමිකාව පිළිබඳ විශ්ලේෂණයක් මෙම ලිපිය මගින් සැපයීමට බලාපොරොත්තු වෙමු.


ශ්‍රී ලංකාව සහ අනෙකුත් දියුණුවෙමින් පවතින රටවල් එළඹ තිබුණු ඇගළුම් පිළිබඳ MFA ගිවිසුම (Multi Fibre Agreement-MFA) 2005 දී අවසන් විය. එනමුත් ශ්‍රී ලංකාව ඇඟළුම් අපනයන පිළිබඳ අනුගමනය කරන ක්‍රියාපිළිවෙතෙහි වෙනසක් මෙමගින් සිදු නොවීය. පසුගිය දශක කිහිපය පුරාවටම ශ්‍රී ලාංකික අපනයන සංයුතිය ඉතා ඉහළින් වැජඹීමට ඇඟළුම් අපනයන සමත්විය. 1980 දී කෘෂිකාර්මික අපනයන අභිබවමින් ඉදිරියට පැමිණි කාර්මික අපනයන ශ්‍රී ලංකාවේ අපනයන පදනම තුළ සුවිශේෂී වෙනසක් සිදුකළ අතර, ඇඟළුම් එහි පුරෝගාමිත්වය දැරීය.

වර්ෂ 2000 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 49% ක් වැනි ඉතා ඉහළ අගයක් වාර්තා කිරීමට ඇගළුම් අපනයන සමත්විය. MFA ගිවිසුම 2005 දී ඉකුත් වීමට කල් මැනීමත් සමගම එය ක්‍රමිකව අඩුවීමට පටන් ගත් අතර, 2012 වන විට 33% ක් වැනි අගයක් දක්වා පහත වැටෙමින් 1991 දී තිබූ මට්ටමටම නැවතත් ගමන් කරන ලදි. කර්මාන්ත අපනයන තම ස්ථාවරත්වය රැකගැනීම සඳහා කෙතරම් උත්සාහ දැරූවද ඒ සඳහා ක්‍රියාත්මක කළ ඇතැම් උපාය මාර්ග ඊට ගැටලුවක් විය. උදාහරණ ලෙස කාර්මික භාණ්ඩවල වටිනාකම ඉහළදැමීම සහ විශේෂීකරණය දැක්විය හැක.




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව


ශ්‍රී ලංකාවේ ඇඟළුම් වලින් හරි අඩක් පමණ අපයනය කරනු ලබන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයටයි (ඇ.එ.ජ.). ඇඟළුම් අපනයන තුළ ඇති ප්‍රධාන ඇඟළුම් භාණ්ඩ 15 ඇ.එ.ජ.ට සිදුකළ ඇඟළුම් අපනයන වලින් 2002 දී 1/3 ක පමණ අගයක් ගත් අතර, 2012 පමණ වන විට 3/5 ක පමණ අනුපාතයක් දක්වා ඉහළ යන ලදි. මින් පෙනී යන්නේ ඇ.එ.ජ. ට සිදුකරන ඇඟළුම් අපනයන විශේෂීකරණය වූ ඇඟළුම් භාණ්ඩ කිහිපයක් වටා ඒකරාශී වී ඇති බවයි.




මූලාශ්‍රය : ඇ.එ.ජ. ජාත්‍යන්තර වෙළඳ කොමිසම

නව සියවසේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව MFA ගිවිසුමේ අවසානය සඳහා සූදානම් වුවද, ප්‍රධාන ඇඟළුම් අපනයන භාණ්ඩ 5 අපනයනයේ වර්ධනය තවදුරටත් ක්‍රියාකාරී අවධියක පසුවිය. 2005 දී MFA ගිවිසුම අවසන් වීමත් සමගම මෙම වර්ධනය අඩාළ වන අතර 2007 දී එය ශ්‍රී ලංකා අපනයනවලට ඉතා තදින් දැනීමට පටන් ගනී. 2007 දී ප්‍රධාන භාණ්ඩ 5ට අයත් ඇඟළුම් කොටස් මිලියන 7.3 ක් පමණ අපනයනය සිදුකළ අතර, 2012 වන විට එය කොටස් මිලියන 5.6 ක පමණ අගයක් දක්වා ඉතා සීඝ්‍ර ලෙස පහත වැටුනි. (රූප සටහන 2)

රූප සටහන 03: අපනයන ප්‍රමාණය සහ වටිනාකම අතර පරතරය




මූලාශ්‍රය : ඇ.එ.ජ. ජාත්‍යන්තර වෙළඳ කොමිසම

කෙසේ නමුත් ඇඟළුම් කොටස් අපනයන තුළ සිදුවූ මෙම පසුබෑම ඇඟළුම් අපනයන වටිනාකම තුළින් පිළිබිඹු නොවීම. 2007 දී ඇ.ඩො. මිලියන 575 ක පමණ වටිනාකමක් ගත් ඇඟළුම් අපනයන (ප්‍රධාන භාණ්ඩ 5) 2002 ඇ.ඩො. මිලියන 568 ක් ලෙස 2007 වටිනාකමට ආසන්න අගයක් ගන්නා ලදි. ඇතැම් විට යුද්ධය අවසාන වීමත් සමග සිදුවූ ආර්ථික පිබිදුම මීට ආසන්න හේතු සාධකයක් විය හැක. (රූප සටහන 3)

ඒ අනුව ඇඟළුම් අපනයන වල ප්‍රධාන භාණ්ඩ 5 තුළ 2002 දී 18% - 2012 දී 31% දක්වා සිදුවූ ප්‍රසාරණය අපනයන වල මිල ඉහළ යෑම මත වටිනාකම තුළ සිදුවූ වර්ධනයක් ලෙස පැහැදිලිව හඳුනාගත හැක. මෙම කාල පරාසය තුළ අපනයනය කළ ඇඟළුම් කොටස් වල සිදුවූ සීඝ්‍ර පසුබෑම අභිබවමින් අපනයන වටිනාකම 25% ක වර්ධනයක් පෙන්වීමට සමත්වේ.

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ සිදුවන එකතු කළ අගයේ වටිනාකමෙහි වර්ධනයේදී බොහෝ විට අමුද්‍රව්‍ය වල සිට අවසන් භාණ්ඩය දක්වා සිදුවන භෞතික ක්‍රියාවලියට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන මෙම අවස්ථාවෙන් ඔබ්බට ගොස් නව නිර්මාණ හා සන්නාම දියුණු කිරීමටත් ඇඟළුම් අපනයන තුල තම ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට දැඩි කැපවීමක් දක්වා ඇත.


ප්‍රධාන ඇඟළුම් අපනයන ආයතන තම ගැනුම්කරුවන්ගේ රුචිකත්වයට වඩාත් ගැලපෙන පරිදි ඉතා ආකර්ෂණීය නිර්මාණ ඉහළ ප්‍රමිතියකින් යුතුව නිම කිරීමට විශාල උනන්දුවක් දක්වයි. එමෙන්ම තමන්ට ආවේණික වූ ඉහළ ප්‍රමිතිගත සන්නාම (Amante සහ Avirate වැනි) ගොඩනැගීමටත් නැනෝ තාක්‍ෂණය මුල් කරගනිමින් අනාගත ඉල්ලුමට සරිලන විශේෂිත ඇඟළුම් නිෂ්පාදනයටත් සුවිශේෂී අවධානයක් යොමු කොට ඇත.

පෙර සඳහන් කර ධනාත්මක වර්ධනයන් සමස්ත ඇඟළුම් කෙෂ්ත්‍රයටම පොදු තත්ත්වයක් නොවේ. මෙය ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ ක්‍රියාත්මක වන මනා කළමණාකරණයකින් යුතු ඉහළම ගණයේ ඇඟළුම් ආයතන තුළ පමණක් සිදුවන ක්‍රියාදාමයකි. MFA ගිවිසුම අවලංගු වීමත් සමගම ඇඟළුම් කර්මාන්තයේ නියුතු බොහෝ ආයතනවලට තම තරඟකාරිත්වය රැකගැනීමට විශාල සටනක් දීමට සිදුවිය. කෙසේ වුවත්, 2007-2010 කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇඟළුම් ආයතන පමණය 30% කින් පමණ අඩුවී ඇත. (2007 දී ශ්‍රී ලංකාවේ ඇඟළුම් ආයතන 2900 ක් පමණ ක්‍රියාත්මක වූ අතර 2010 වන විට එය 2000 දක්වා පහත වැටිනි.)

ඇඟළුම් කෙෂ්ත්‍රයේ සේවා නියුක්තියෙහිද විශාල බිඳ වැටීමක් දක්නට ඇත. 2007-2010 කාලය තුළ සේවා නියුක්තිය 780,000 ක සිට 550,000 දක්වා අඩු වී ඇත. මින් පෙනී යන්නේ ශ්‍රී ලාංකික ඇඟළුම් කෙෂ්ත්‍රයේ සිදුවී ඇති දැඩි බිඳවැටීම එහි සෑම අංශයක් තුළින්ම පිළිබිඹු වන බවයි.

ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනයෙහි පුරෝගාමියා ලෙස 1992 - 2001 දක්වා කාලය තුළ ඇඟළුම් අපනයනය 13% ක පමණ සාමාන්‍ය වේගයකින් (Average Growth) වර්ධනය වූ අතර, අනිකුත් අපනයන වර්ධනය වූයේ 7% ක වේගයකිනි. නමුත් 2002 - 2012 දශකය තුළ ඇඟළුම් අපනයන වර්ධන වේගය 5%ක් ලෙස මන්දගාමී තත්ත්වයකට පත්වූ අතර, අනිකුත් අපනයන 9% ක සාමාන්‍ය වර්ධන වේගයක් පවත්වාගෙන යෑමට සමත්විය.

රූප සටහන 04: ඇඟළුම් කෙෂ්ත්‍රයේ බිඳවැටීම




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ඇඟලුම් ක්ෂේත්‍රය තුළ "සුදු යට ඇඳුම්" යනු වටිනාකමින් අඩු ශ්‍රම පිරිවැයට ඉතා සංවේදී ඇඟලුම් අපනයන තුළ පහළම ස්ථරයට අයත් වන ඇඟලුම් නිරූපනය කරන්නකි. ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන ඇඟලුම් කර්මාන්තශාලා කිහිපයක් පමණක් මෙම ස්ථරයෙන් මිදීමට සමත්වී ඇතත්, අති මහත් බහුතරය තවමත් ක්‍රියාත්මක වන්නේ මෙම පහළ ස්ථරය තුළය. එමනිසා ශ්‍රී ලාංකික අපනයන වර්ධනයට ඇඟලුම් ක්ෂේත්‍රයෙන් සැලකිය යුතු දායකත්වයක් ඉදිරියේදී ලැබේ යැයි අපේක්ෂා කිරීම අපහසුය. වඩාත් තීව්‍ර ගැටළුව වන්නේ මෙය ඇඟලුම් අපනයනයට පමණක් පොදු සාධකයක් නොවීමයි. එනම්, 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ ශ්‍රී ලංකාව සිය අපනයන පදනම කෘෂිකාර්මික අපනයන වල සිට කාර්මික අපනයන වලට වෙනස් කර ගැනීමට සමත්වුවද එය අපනයන ආර්ථිකය තුළ ප්‍රාථමික මට්ටමේ වෙනස්වීමකි. ඉන් අනතුරුව ගෙවුනු දශක 3 ක කාලය තුළ අපනයන පදනම සැලකිය යුතු වෙනසකට භාජන වී නොමැති අතර ඇඟලුම්, තේ, කුළුබඩු, රබර් නිෂ්පාදන සහ මැණික් ශ්‍රී ලාංකික අපනයන සංයුතියේ 70% ක පමණ ඉහළ අගයක් ගනී.

දකුණු කොරියාව වැනි බොහෝ රටවල් අපනයන කාර්මීකරණය තුළ මුලින්ම ඇඟලුම් කර්මාන්තය තුළ කේන්ද්‍රගත වුවද, පසුකාලීනව තම කාර්මික අපනයන පදනම සාර්ථක ලෙස විවිධාංගීකරණය කරගනිමින් නව භාණ්ඩ සහ වෙළඳපොල වලට තම අපනයනය පුළුල් කරගැනීමට සමත්විය. නමුත් මෙවැනි සාර්ථක අපනයන දියුණුවක් සාක්ෂාත් කරගැනීමට ශ්‍රී ලංකාව තවමත් අපොහොසත් වී ඇත. මේ අනුව බලන කල ශ්‍රී ලංකාවේ අනාගත අපනයන ක්ෂේත්‍රයේ දියුණුව ඉතා වැදගත් සාධක 2 ක් මත රඳා පවතී. පළමුවැන්න කාර්මික අපනයනය විවිධාංගීකරණය සහ එහි වර්ධනයයි. දෙවැන්න කාර්මික අපනයන වල ප්‍රමිතිය දියුණු කිරීම සහ "සුදු යට ඇඳුම්" ඔබ්බට ගිය ඉහළ මට්ටමේ අපනයන නිෂ්පාදනයට යොමුවීමයි.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**